අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. ජයතිලක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ අගෝස්තු මස 12 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ, මුප්පනේ ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 232 දරන එෆ්වීපී 172 ලොට් 55 ටී හි කොටසක් වන කෝවිල්ගොඩහේන නමැති ඉඩමට 2006.04.09 දින බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් සකසන ලද අංක 2758 පිඹුර ප්‍රකාර ලොට් 1 දරන ඉඩමට මායිම් උතුරට: ප්‍රධාන පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද ; 2006.03.06 දින බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් සකසන ලද අංක 2742 පිඹුරෙහි වූ ලොට් 1 න් ද, එස්. වීරසිංහගේ ඉඩමෙන් ද නැගෙනහිරට : එස්. වීරසිංහගේ ඉඩමෙන් ද එෆ්වීපී 172 හි ලොට් 55 සී.එන් ද ; දකුණට : එෆ්වීපී 172 හි ලොට් 55 සීඑන් ද දැන් කේ. එස්. ද සිල්වාට අයිති පී. ඒ. ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද සහ බටහිරට: දැන් කේ. එස්. ද සිල්වාට අයිති පී. ඒ. ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද, ප්‍රධාන පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් හතක (අක්. 00, රූ. 00, පර්. 37) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවද සමග මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 54/208 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

11-421

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කළින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0900000442.

ණයකරුගේ සම්පූර්ණ නම : කොඩිතුවක්කු විගලතැන්න පාලිත එදිරිසිංහ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. බී. අබේසූරිය විසින් ලියා සහතික කරන ලද අංක 7129 හා 2000.02.07 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන්

හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑ පන්දහස් හයසිය තිහයි ශත හැත්තෑ පහක ( රු. 75,630.75) මුදලක් වර්ෂ 2005.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටහයදහස් හාරසිය හතලිස් හතයි ශත විසිපහක (රු. 66,447.25) මුදල ද වර්ෂ 2005.06.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් නවදහස් එකසිය අසූතුනයි ශත පනහක් (රු. 9,183.50) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑ පන්දහස් හයසිය තිහයි ශත හැත්තෑ පහක (රු. 75,630.75) ද,

(2) එකී රුපියල් හැටහයදහස් හාරසිය හතළිස් හතයි ශත විසිපහක (රු. 66,447.25) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% බැගින් වන පොළියක් 2005.07.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. පී. ආනන්ද යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005ක් වූ අගෝස්තු මස 11 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, නැගෙනහිර කපුගම ග්‍රාමයෙහි පිහිටි කැබලි අංක ඒ සහ බී ඒකාබද්ධ කරන ලද පල්ලියගුරුගේ වත්ත නමැති ඉඩමට 1993.06.29 දින එස්.කේ. ජී. සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 141 පිඹුර ප්‍රකාර ලොට් 2 ට උතුරට සහ ඊසානට : ලොට් සී.ඩී සහ ඊ ද ; ගිණිකොණට : පිඹුරු අංක 141 හි ලොට් 3 සහ 4 ද; දකුණට: සහ නිරිතට ලොට් 6 (අඩි 10 පළල පාර) ද ; වයඹට : පිඹුරු අංක 141 හි ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අක්. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 506/123 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

11-423

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2008.08.26 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එම්. වයි. එම්. තව්ෆික් මයා විසින් සහතික කරන ලද 2007.02.22 දිනැති අංක 6370 දරන බැඳුම්කරය මත මුල් මුදල් හා 2007.08.22 දින තෙක් පොලිය වශයෙන් රුපියල් දොළොස් ලක්ෂ විසිපන්දහස් හත්සිය හැත්තෑවයි ශත අසූහයක (රු. 12,25,770.86) මුදල සමග රුපියල් එකොළොස් ලක්ෂ විසිහත්දහස් අටසිය අනූපහයි ශත පනස් දෙකක (රු. 11,27,895.52) මුදල මත 2007.08.23 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසිපහයි දශම පහක (25.5%) වාර්ෂික පොලියක් ද නාඋල, දඹුල්ල පාර, "තාරුෂි බතික්ස් " හි පදිංචි වීරකෝන් ආරච්චිලගේ සුදන්ත වීරකෝන් මයා යන අයගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2007.02.22 වැනි දිනැති අංක 6370 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් දොළොස් ලක්ෂ විසිපන්දහස් හත්සිය හැත්තෑවයි ශත අසූහයක (රු. 12,25,770.86) මුදල සමග 2007.08.23 වෙනි දින සිට විකිණීම කෙරෙන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වෙනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර, වගපනහ උඩසිය පත්තුවේ නාලන්ද හි , ඉතා නිවැරදි ලෙස නාඋල හි පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. එස්. සමරසිංහ මයා විසින් සාදන ලද 1988 මැයි මස 25 වෙනි දිනැති අංක 3174 දරන පිඹුරේ කැබලි අංක 1 යනුවෙන් පෙන්නුම් කර ඇති, "අරන්ගල වත්ත" යැයි හඳුන්වනු ලබන ඉඩමෙන් කොටසක් වන, එකී අංක 3174 දරන පිඹුර අනුව, උතුරට : ගැමියන් විසින් හිමිකම් කියන ලද අරන්ගල වත්තේ ඉතිරි කොටස ද ; ඊසාන දෙසට : දඹුල්ල සිට මාතලේට යන මහ පාර ද ; දකුණට : ඉහත කී අංක 3174 දරන පිඹුරේ කැබලි 6 යනුවෙන් පෙන්නුම් කරන ලද අඩි 10ක් පළලැති ප්‍රවේශ මාර්ගය ද ; බස්නාහිරට : එකී අංක 3174 දරන පිඹුරේ කැබලි 2 ද, මායිම් වූ රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම දෙකක (අක්. 0, රූ. 1,පර්. 38.2) වපසරියෙන් යුත්, බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කට්ටිය, ඉහත කී අංක 3174 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති අඩි 10ක් පළලැති ප්‍රවේශ මාර්ගය භාවිතා කිරීමේ අයිතිය සමග එහි තුළ පිහිටා ඇති වැව්ලි හා සෑම සියළු දේත් වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 279/243 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්.එම්. බාලසූරිය මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
නාඋල

11-343

## මහජන බැංකුව - ගාල්ල කොටුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.05 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් මල්කාන්ති චින්තාමනී රණසිංහ විසින් සහතික කරන ලද 2004.02.17 දිනැති අංක 6013 දරන උකස්කරය හා ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සෝමපාල හොරඳුගොඩ ගමගේ විසින් සහතික කරන ලද 2005.01.05 දිනැති අංක 702 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, චන්ද්‍රා ලමාහේවගේ නොහොත් ලමාහේවගේ චන්ද්‍රා ඥානසිරි ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ දාසයදහස් හයසියයයි ශත දොළහ (රු. 116,600.12) ක සහ රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් නමසිය නමයයි ශත අනූදෙක (රු. 176,909.92) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2008.01.24 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් එක්ලක්ෂ දාසයදහස් හයසියයයි ශත දොලහ (රු. 116,600.12) ක සහ 2006.09.07 දින සිට වර්ෂයකට 16% බැගින් රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් නමසිය නමයයි ශත අනූදෙක (රු. 176,909.92) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ දාසයදහස් හයසියයයි ශත දොළහ (රු. 116,600.12) ක සහ රුපියල් එක් ලක්ෂ හැත්තෑ හය දහස් නමසිය නමයයි ශත අනූදෙක (රු. 176,909.92) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 6013 සහ 702 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, මීපෙ හරුමල්ගොඩ පිහිටි හදිගොඩවත්ත, නැමැති ඉඩමේ බෙදූ කැබලි අංක 20, 21, 22, 23 ඒකාබද්ද ඉඩම සඳහා බලයලත් මානක ඇන්ටන් සමරරත්න මහතා විසින් මැන සාදන ලද අංක 1399/2003.12.01 දින පිඹුර ප්‍රකාරව ලොට් සී බෙදූ ලොට් සී1 දරණ කැබැල්ල සඳහා මායිම් උතුරට : අංක ඩී, ඒ1 සහ සී3 දරන කැබලි ද, නැගෙනහිරට : මෙම ඉඩමේම සී2 දරණ කැබැල්ල ද, දකුණට : ගොඩපරගහවත්ත ද, බස්නාහිරට : බී දරණ කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොල, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 874/102 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අංක 1399 දරන පිඹුරෙහි සඳහන් අංක ඒ2 සහ සී3 දරන කැබලි සියලු කටයුතු සඳහා මාර්ග පර්වශතාවය සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

11-377

## මහජන බැංකුව - මහරගම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චන්දිමා ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද අංක 2967 සහ 2008.02.13 වනදින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම කිරිවත්තුඩුවගේ නන්දදාස පෙරේරා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2967 දරන බැඳුම්කරය මත රුපියල් පන් ලක්ෂයක (රු. 500,000) මුදලක් සහ රුපියල් එක් ලක්ෂයක (රු. 100,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් පන්ලක්ෂයක (රු. 500,000) එකී මුදලද 2008.02.22 වන දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට විසි හත (27%) බැගින් තවදුරටත් වූ පොලියද 2008.06.01 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් එක් ලක්ෂයක (රු. 100,000) මුදලක් සහ ඒ මත වර්ෂයකට සියයට විසි හත(27%) බැගින් වූ තවදුරටත් වූ පොළියද විකිණීමේ ගාස්තුද, එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 2967 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපල සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බටවල පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 1983/9000 සහ 2002 ඔක්තෝබර් මස 29 දින දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 7 ද, නැගෙනහිරට: සහ දකුණට : අංක 591 දරන පිඹුරේ ලොට් අංක 1D දරන කොටස ද, බස්නාහිරට : ලොට් අංක 1 හා 2 ද, මායිම් වන්නා වූද, එකී අංක 1983/9000 දරන පිඹුරට අනුව පර්චස් දාහතරයි දශම හතක්(අක්. 0, රූඩ් 0, පර්. 14.7) විශාල වූ ද අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 367/78 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත්ය.

එකී අංක 1983/9000 පිඹුරේ ලොට් අංක 7 ලෙස ලකුණු කර ඇති පාර සඳහා වෙන් කිරීම තුළින්, උඩින් හා දියේ මාර්ග ප්‍රවේශ අයිතියද, මීට ඇතුලත් වේ. අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N367/78 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(බටහිර කලාප II )

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

11-373

### මහජන බැංකුව - හක්මණ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.29 දින පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රූබසිංහ විසින් සහතික කරන ලද 2006.03.28 දිනැති 3225 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් මුණසිංහ ආරච්චිගේ රංජිත් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 3225 යටතේ රුපියල් හාරලක්ෂ හතලිස් එක් දහස් එකසිය හයයි ශත අනූ තුනක (රු. 4,41,106.93) මුදලක් මහජන බැංකුවට දැනට අය වීමට ඇති බැවින් ද, 2007.01.20 දින සිට වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් රුපියල් හාරලක්ෂ හතලිස් එක් දහස් එකසිය හයයි ශත අනූ තුනක (රු. 4,41,106.93) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 "එල් " වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව රුපියල් හාර ලක්ෂ හතලිස් එක් දහස් එකසිය හයයි ශත අනූ තුනක (රු. 4,41,106.93) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 3225 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්ද බඩ පත්තුවේ, උඩුපීල්ලෙගොඩ පිහිටි ලියනගහහේන නමැති ඉඩමේ අංක 11 දරන ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : අඩි පාර ද, නැගෙනහිරට : අඩි පාර සහ මෙම ඉඩමේ අංක 12 දරන කැබැල්ල ද, දකුණට : ඉඩම හරහා වැටී ඇති දිය පාර ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 10 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිහක් (අක්. 0 රූ. 0, පර්. 30) විශාල ඉඩම සහ ඒ තුළ තිබෙන වැවිලි ගොඩනැගිලි යනාදී සියලු දෑද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඊ 415/215 හි ලේඛනගතව ඇත.

මෙම ඉඩම අංක 99/188 දරන පිඹුර ප්‍රකාරව නැවත මනින ලද අතර, එය එහි පහත පරිදි විස්තර වේ :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්ද බඩ පත්තුවේ, උඩුපීල්ලෙගොඩ පිහිටි ලියනගහහේන නමැති ඉඩමේ අංක 11 දරන ඉඩම් කැබැල්ල 1999.11.27 දිනැති ඊ.එම්. ප්‍රේමසිරි බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 99/188 දරන පිඹුර ප්‍රකාරව නැවත මනින ලද අංක 1 දරන කැබැල්ලට එකී පිඹුර ප්‍රකාරව මායිම්, උතුරට : මෙම ඉඩමේ කැබැල්ලක් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 13, 12, 2 දරන කැබලි සහ ඇල ද, දකුණට : මෙම ඉඩමේ අංක 2 දරන කැබැල්ල සහ ඇල ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 10 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිහක් (අක්. 00, රූ. 00, පර්. 30) විශාල ඉඩම හා එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සෑම සියලු දෙය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු - මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38, 1/ඒ, පිට්ටනිය පාර,
මාතර.

11-372

---

### මහජන බැංකුව - අම්බලන්තොට ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදුනී මිය. විසින් සහතික කරන ලද 2006.05.08 දිනැති අංක 1750 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වර්ණී පුෂ්පා එදිරිවීර සහ ලයනල් පද්මසිරි විජේතුංග යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දාහතර ලක්ෂ අසූ හතර දහස් අසූවයි ශත තිස් තුනක (රු. 14,84,080.33) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.09.08 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් දාහතර ලක්ෂ අසූහතර දහස් අසූවයි ශත තිස් තුනක (රු. 14,84,080.33) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29L වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩු වී එකී රුපියල් දාහතර ලක්ෂ අසූ හතර දහස් අසූවයි ශත තිස් තුනක (රු. 14,84,080.33) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ඉහත කී අංක 1750 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස් කර ඇති දේපළ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ වේරදුව පිහිටි බෝගහලන්ද නමැති ඉඩමේ B අක්ෂරය දරන කැබැල්ල, බලයලත් මිනින්දෝරු එන්. විජේවීර, මහතා විසින් මැන 1990.11.01 දින සම්පාදිත අංක 4078 දරන පිඹුරේ බෙදා වෙන් කළ අංක 01 දරන කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්. උතුරට : කජ්ජුගහවත්ත ද, නැගෙනහිරට : වැලිගමගේ බෝගහලන්ද නමැති ඉඩමේ අංක 4 සහ 5 දරන කැබැලි ද, දකුණට : ප්‍රාදේශීය සභා පාරද, බස්නාහිරට : අංක 4076 දරන පිඹුරෙහි කැබලි අංක 02 ද යන සතර මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් එකයි දශම අටයි හතයි පහ (අ.0, රූ. 1, පර්. 1.875) ක් විශාල ඉඩම සහ එය තුළ පිහිටි වැවිලි සහ ගොඩනැගිලි යනාදී සියලු දෙයද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ ඒ 430/221 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර ප්‍රාදේශීය කළමනාකරු,
හම්බන්තොට.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 7ඒ, ටවර්හිල් මාවත,
හම්බන්තොට.

11-371

---

### මහජන බැංකුව - හික්කඩුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2006.02.09 දිනැති අංක 444 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අගම්පොඩි නීල් නන්දන ද සිල්වා සහ මුණසිංහ විතානගේ ධම්මිකා යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එකොලොස් ලක්ෂ පහලොස්දහස් නමසිය හැත්තෑ අටයි ශත අනූතුන (රු. 11,15,978.93) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.01.21 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් එකොලොස් ලක්ෂ පහලොස්දහස් නමසිය හැත්තෑ අටයි ශත අනූතුන (රු. 11,15,978.93) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එකොලොස් ලක්ෂ පහලොස්දහස් නමසිය හැත්තෑ අටයි ශත අනූතුන (රු. 11,15,978.93) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 444 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ හික්කඩුව වැරැල්ලාන පිහිටි ළිඳමුලවත්ත, පැලවත්ත, තල්ගහවත්ත සහ ගනේවත්ත නමැති ඉඩමේ අංක 5 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු කේ. එම්. ආර්. සිල්වා විසින් වර්ෂ 1936.03.04 සහ 1939.10.16 දින මැන සාදන ලද අංක 417 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේම කැබලි අංක 4 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම කැබලි අංක 06 ද, දකුණට : පන්සලට යන පාර ද, බස්නාහිරට : හෙනගැහුවත්ත ඉඹුල්ගහවත්ත ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස් පහක් (අ. 0, රූ. 0, පර්. 35) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනාදී සියළු දේද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 668/277 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අංක 417 දරන පිඹුරෙහි සඳහන් කැබලි අංක බී, සියළු කටයුතු සඳහා භාවිතා කිරීමේ මාර්ග පරවශ්‍යතාවය සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22,
පහළ ඩික්සන් පාර,
ගාල්ල.

11-374

---

### මහජන බැංකුව - වැල්ලවාය

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.06.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. දයාරත්න මහතා විසින් සහතික කරන ලද 2004.10.08 දිනැති අංක 6163 දරන උකස්කරයේ ප්‍රකාර ගෙවීම් වැල්ලවාය, යාලබෝව, අංක 01, සර්වෝදය මාවතෙහි පදිංචි තේනබදුගේ සුනිල් ධර්මපාල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 6163 දරන උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ පනස් හය දහස් අටසිය පහලොවයි ශත දහසයක් (රු. 4,56,815.16) මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද එකී රුපියල් හාරලක්ෂ පනස් හය දහස් අටසිය පහලොවයි ශත දහසයක් (රු. 4,56,815.16) සඳහා 2007.02.11 දින සිට සියයට පහලොවයි දශම හතයි පහයි (15.75%) බැගින් පොළිය ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද වෙන්දේසි ගාස්තුවද වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවා ද අඩු කරගෙන අදාළ මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. ජයතිලක මහතා විසින් එකී අංක 6163 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තර

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවාය කෝරළයේ දැනට වැල්ලවාය ප්‍රාදේශීය සභා

සීමාව තුළ යාලබෝව (එප්. ටී. පී. 1) ගමේ පිහිටා ඇති "යාලබෝව වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. සී. පුෂ්පකුමාර මහතා 1998.12.20 දින මැන සාදන ලද අංක 2030 දරන පිඹුරු පතේ පෙන්නුම් කෙරෙන අතර කැබලි අංක 88 දරන බෙදූ ඉඩම් කැබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : පාර සහ කැබලි අංක 84 ද, නැගෙනහිරට : කැබලි අංක 87 සහ 89 ද, දකුණට : පාර ද සහ බස්නාහිරට : රජයේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි අක්කර එකයි, පර්චස් විසි හතර (අක්. 01, රූඩ් 0, පර්චස් 24) ක් හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම හතරයි හයයි හතර (හෙක්. 0.464) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ඇතුලු සියළු දේත් සහ එකී ඉඩම් කැබැල්ලට යාමට ඊමට වූ සියලු මාර්ගවල මාර්ග අයිතිය ද වේ.

මෙකී ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්/41/170 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
මොණරාගල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 719, වැල්ලවාය පාර,
මොණරාගල.

11-375

---

## සෙලාන් බැංකුව පීඑල්සී - ෆස්ට් සිටි ඔෆිස් ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියා පදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0011-011504-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.25 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඒ.ඩබ්ලිව්.ඒ. එමැනුවෙල් විසින් සහතික කරන ලද 1995 ජුලි 14 දිනැති අංක 150, ප්‍රසිද්ධ නොතාරිස් පී.ආර්. ද ලිවේරා විසින් තුනම සහතික කරන ලද 1993 ජුනි 01 දිනැති අංක 1066, 1995 ජනවාරි 10 දිනැති අංක 2806 සහ 1995 ජනවාරි 10 දිනැති අංක 2808 සහ 2002 ඔක්තෝබර් 3 දිනැති යන්ත්‍ර සූත්‍ර උකස් ඔප්පුව සහ ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රාගි සිවදාසන් විසින් දෙකම සහතික කරන ලද උස්වැටකෙයියාව පදිංචි ජයමාන්න මොහොට්ටිගේ දොන් ඇන්තනි මයිකල් යන අය උකස්කරු වශයෙන්, 2005 ජනවාරි 19 දිනැති අංක 225 සහ 2008 මැයි 26 දිනැති අංක 658 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, උස්වැටකෙයියාව ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 703 දරන 1982 අංක 17 දරන සමාගම පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ස්රීමික් සී ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය සාමූහිකව බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පන්කෝටි දසලක්ෂ විසිහය දහස් හයසිය දහයයි ශත හැටපහක (රු. 5,10,26,610.65) මුදලක්, 2008 අප්‍රේල් 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 5,10,26,610.65 මුදල ද, 2008 මැයි 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 150, 1066, 2806, 2808, 225, 658 දරන බැඳුම්කර සහ යන්ත්‍ර සූත්‍ර ඔප්පු මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි 2 වැනි 3 වැනි සහ 4 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සහ 5 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති යන්ත්‍රසූත්‍ර බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් 8 දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වට කුඹුර සහ වැලිහිදේකුඹුර, හුන්ගන්වෙලකුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3ඒ1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු 22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3ඒ හි ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒ හි කොටසක් ද, නැගෙනහිරට : යෝජිත කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (කලින් එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒ හි කොටසක්) ද, දකුණට : අත්හරින ලද පාර (එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් කොටස් නොකරන ලද පාර) සහ බස්නාහිරට : පාර (අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒ හි කොටසක්) ද යන මායිම් තුළ රූඩ් එකයි, පර්චස් තිස් එකයි දශම අටයි හයක් (අ. 0, රූ. 1, පර්. 31.86) (හෙක්ටයාර 0.1817) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී ඩී. දොඩන්වෙල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් 08 දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වටකුඹුර සහ වැලිහිදේකුඹුර, හුන්නන්වෙලකුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3ඒ2 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එම්.ඩී.ජේ.

පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු 22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3ඒ හි ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම කොටසට මායිම්, උතුරටඃ ආසිරි හෝටල් පරිශ්‍රය (එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒ හි කොටසක්) ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අත්හරින ලද පාර (එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් කොටස් නොකරන ලද පාර ද) සහ බස්නාහිරට : යෝජිත කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (කලින් එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒ හි කොටසක්) ද යන මායිම් තුළ අක්කර එකයි පර්චස් විසි එකයි, දශම හයයි දෙකක් (අ. 1, රූ. 0, පර්. 21.62) (හෙක්ටයාර් 0.4594) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් මස 08 වැනි දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වටකුඹුර සහ වැලිහිදේකුඹුර, හුන්ගන්වෙලකුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3බී1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු, එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු මස 22 වැනි දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3බී හි ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අත්හරින ලද පාර (එකී අංක 2884 දරන සැලැස්මේ කොටස් නොකරන ලද පාර) ද, නැගෙනහිරට : යෝජිත කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (කලින් එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3බී හි කොටසක්) ද, දකුණට : එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 4ඒ සහ බස්නාහිරට : කලින් ඇල දැන් සංස්කරණය කරන ලද පාර (එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒහි කොටසක්) ද යන මායිම් තුළ රූඩ් තුනයි, පර්චස් හතයි දශම බිංදුවයි හයක් (අ. 0, රූ. 3, පර්. 07.06) (හෙක්ටයාර් 0.3214) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, දකුණ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වල විසින් සාදන ලද 2008 සැප්තැම්බර් මස 08 වැනි දිනැති අංක 7311 දරන සැලැස්මේ සඳහන් හුන්ගන්වටකුඹුර සහ වැලිහිදේකුඹුර, හුන්ගන්වෙලකුඹුර නමින් ද හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 3බී2 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු, එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971 අගෝස්තු මස 22 වැනි දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3බී හි ඉතිරි කොටසෙහි කොටසක්) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අත්හරින ලද පාර (එකී අංක 2884 දරන සැලැස්මේ කොටස් නොකරන ලද පාර) ද, නැගෙනහිරට : යෝජිත කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (කලින් එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3බී හි කොටසක්) ද, දකුණට : එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 4ඒ සහ බස්නාහිරට : දැන් යෝජිත කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය (කලින් එකී අංක 2884 දරන සැලැස්මේ සඳහන් ලොට් 3බී හි කොටසක්) ද, යන මායිම් තුළ අක්කර එකයි, පර්චස් නවයයි දශම දෙකයි එකක් (අ. 1, රූ. 0, පර්. 09.21) (හෙක්ටයාර් 0.4280) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

පෙර කී විස්තර කරන ලද අංක 7311 දරන සැලැස්මේ සඳහන් ලොට් 3ඒ1, 3ඒ2, 3බී1 සහ 3බී2 ලකුණු කළ එකී ඉඩම් කැබලි පහත පිළිවෙලින් විස්තර කරනු ලබන බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971.08.22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3ඒ සහ ලොට් 3බී හි ඉතිරි කොටසෙහි කොටස් වේ.

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ දකුණ රාගම් පත්තුවේ තාරාකුලිය වඩාත් නිවැරදිව දැලතුර පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1971.08.22 දිනැති අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හුන්ගන්වෙල කුඹුර සහ වැලිහිඳ කුඹුර යනුවෙන් ද හඳුන්වනු ලබන හුන්ගන්වෙල සහ වැලිහිඳකුඹුර නමැති ඉඩම ලොට් 3ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එච්. කිව්. ටී. තිසේරාට හිමි ලොට් 2ඒ ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 6 සහ ඇල ද යන මායිම් තුල අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දහසයයි දශම පහයි බිංදුවක් (අ.2, රූ. 3, පර්. 16.50) විශාල, එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී123/110ඒ යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී තාරාකුලිය වඩාත් නිවැරදිව දැලතුර පිහිටි පෙර කී අංක 2884 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හුන්ගන්වෙල කුඹුර සහ වැලිහිඳ කුඹුර යනුවෙන් ද හඳුන්වනු ලබන හුන්ගන්වෙල සහ වැලිහිඳකුඹුර නමැති ඉඩමේ ලොට් 3බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 4ඒ සහ බස්නාහිරට : ලොට් 6 සහ ඇල ද යන මායිම් තුළ අක්කර දෙකයි, රූඩ් දෙකයි, පර්චස් තිස් නවයයි දශම දෙකයි පහක් (අ. 2, රූ. 2, පර්. 39.25) විශාල, එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ හිමිකම් බී123/109 යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ උස්වැටකෙයියාව පරණ අම්බලම වරිපනම් අංක 102 දරන ගල්බානතොටවත්ත නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : එල්. ඩී. අපෝන්සු නානායක්කාර ගේ ඉඩම ද, නැගෙනහිරට : බෝපිටියට යන කරත්ත පාර ද, දකුණට : එල්. ඩී. පී. විල්ප්‍රඩ් නානායක්කාරගේ මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : මුහුද ද යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු ඒ. සී. අලස් විසින් සාදන ලද 1957.05.08 දිනැති අංක 1423 දරන සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් තිස් හයක් (අ. 0, රූ. 1, පර්. 36) විශාල, ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 214/244හි ලියාපදිංචි කර ඇත.

**තුන්වැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ කළුතර බැද්ද කාලමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු එන්. ද එස්. වීරක්කොඩි විසින් සාදන ලද 1988.09.08 දිනැති අංක 2370 දරන සැලැස්මේ සඳහන් කහටගහවත්ත නමැති ඉඩමේ ලොට් බී ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : කහටගහවත්ත 1/3ක කොටස ද, නැගෙනහිරට : ඇලබොඩවත්ත ද, දකුණට : කහටගහවත්ත 1/3 ක කොටස ද සහ අංක 2370 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ සහ බස්නාහිරට : ලොට් ඒ (කොටසක්) සහ කොළඹ-ගාල්ල මහා මාර්ගය යන මායිම් තුළ පර්චස් විසි අටයි දශම දෙකයි බිංදුවක් (අ.0, රූ. 0, පර්. 28.20) විශාල, එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම. මෙය කළුතර ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 105/93 යටතේ ලියාපදිංචි කර ඇත.

## හතරවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභාවේ පමුණුගම උප කාර්යාල සීමාව තුළ පරණ අම්බලම පිහිටි බලයලත් මිනින්දෝරු එන්. ඩී. ජී. සී. ගුණසේකර විසින් සාදන ලද 1993.11.23 දිනැති අංක 470 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නුගගහඹිවිට සහ නුගගහවත්ත සහ ගල්බානතොටේවත්ත නමැති කොළඹ පාර වරිපනම් අංක 209/4 දරන ලොට් ඩී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. ජේ. සී. රැද්රිගුගේ ඉඩම ද, නැගෙනහිරට : පාර (අඩි 12ක් පළල) සහ ඩී. සී. එස්. රැද්රිගුගේ ඉඩම ද, දකුණට : එමලින් නානායක්කාරගේ ඉඩම සහ බස්නාහිරට : ජේ. එම්. ඩී. ඒ. මයිකල් සහ එල්. ඩී. සී. නානායක්කාර ගේ ඉඩම ද යන මායිම් තුළ එකී අංක 470 දරන සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් පහලොවයි දශම අටයි දෙකක් (අ.0, රූ. 1, පර්. 15.82) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 296/139හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 470 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අඩි 10ක් පළල සහ අඩි 12ක් පළල යනුවෙන් ලකුණු කළ මාර්ගය සඳහා වෙන්කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ.

## පස්වැනි උපලේඛනය

| *අයිතම් අංකය* | *ප්‍රමාණය* | *විස්තරය* |
|---|---|---|
| 1. | 04 | කන්ටැක්ට් ප්ලේට් ෆ්‍රිසර්ස් මොඩ්ල් එස්පීඑෆ් 01-08-ආර්22<br>සෙල්ෆ් කන්ටේන්ඩ් රිෆ්රිජිරේශන් ධාරිතාව 200 කි.ග්‍රෑ/පැය 3<br>ස්පීඩ් ෆ්‍රීස් ටෙක්නොලොජි සිංගප්පූරුව නිෂ්පාදිත<br>රට - ජර්මනිය<br>මිල දී ගත් වර්ෂය - 1993 - 1<br>1994 - 3 |
| 2. | 01 | බ්ලාස්ට් ෆ්‍රිසර් මොඩ්ල් බීජී 642ටී<br>මේක් - බයිටර් ඕපන් ඩ්‍රයිව් මෝටර<br>45එච්ජී වර්ගය - වී-041305<br>ධාරිතාව 500 කි.ග්‍රෑ/පැය 3<br>නිෂ්පාදිත රට - ජර්මනිය<br>මිල දී ගත් වර්ෂය - 1994 |
| 3. | 01 | සීතල කාමර මේක් - බයිටර්<br>වර්ගය - වී-331446<br>ධාරිතාව - ටොන් 30<br>නිෂ්පාදිත රට - ජර්මනිය<br>මිල දී ගත් වර්ෂය - 1994 |
| 4. | 01 | සීතල කාමර මේක් - බයිටර්<br>වර්ගය - වී-100734<br>ධාරිතාව - ටොන් 15<br>නිෂ්පාදිත රට - ජර්මනිය<br>මිල දී ගත් වර්ෂය - 1994 |
| 5. | 01 | ස්ටෑන්ඩ්බයි විල්සන් ජෙනරේටර්<br>මේක් - විල්සන් පී6 පීසස්<br>ඕල්ටර්නේටර් - ස්ටැම්ෆර්ඩ්<br>3 පේස් - 400/415 වොල්ට්ස් 50 හර්ට්ස්<br>ජීඑෆ් 0.8<br>නිෂ්පාදිත රට - එංගලන්තය<br>මිල දී ගත් වර්ෂය - 1994 |
| 6. | 10 | හයිඩ්‍රොලික් කිරණ තරාදි<br>මේක් - බර්ක්ල්<br>ධාරිතාව - 0-500 කි.ග්‍රෑ.<br>නිෂ්පාදිත රට - ඇමරිකා එක්සත් ජනපදය<br>මිල දී ගත් වර්ෂය - 1995 |
| 7. | 20 | ස්ටේන්ලස් ස්ටීල් මේස<br>8'x4' 2 1/2'<br>දේශීය නිෂ්පාදිත<br>මිල දී ගත් වර්ෂය - 1995 |

| අයිතම් අංකය | ප්‍රමාණය | විස්තරය |
|---|---|---|
| 8. | 1250 සෙට්ස් | ඇලුමිනියම් ෆ්‍රීසිං ට්‍රේස් උඩ තැටිය සමඟ<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිල දී ගත් වර්ෂය - 1995 |
| 9. | 150 | ප්ලාස්ටික් රිඉන්ෆෝස්ඩ් ක්රේට්ස්<br>10'x24'x16'<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිල දී ගත් වර්ෂය - 1995 |
| 10. | 650 | ප්ලාස්ටික් රිඉන්ෆෝස්ඩ් ක්රේට්ස්<br>13'x182'x26'<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිල දී ගත් වර්ෂය - 1995 |
| 11. | 01 | අයිස් ක්‍රෂර් මේක් - ස්පීඩ් ෆ්‍රීස්<br>මොඩ්ල්-එස්කේඑෆ් 01-08-22<br>ධාරිතාව - 4 කි.ග්‍රෑ./පැය<br>නිෂ්පාදිත රට - සිංගප්පූරුව<br>මිල දී ගත් වර්ෂය - 1995 |
| 12. | 01 යුනිට් | පවර් ඩිස්ට්‍රිබියුෂන් සිස්ටම්<br>මේන් කන්ට්‍රෝල් පැනල්, සම් බෝර්ඩ්ස්, ස්විච් ජියර්<br>කේබල්ස්<br>සවි කරන ලද අවුරුද්ද - 1994 |
| 13. | 01 යුනිට් | වෝටර් සප්ලයි සිස්ටම්<br>ජිනසේන පොම්ප 2යි, විවර්හෙඩ් ටැන්ක්ස්<br>කන්ට්‍රෝල් පැනල් - පයිප්ප සහ ෆිටිංස් |
| 14. | 01 ලොට් | ටූල්ස්, උපාංග, අමතර කොටස්, එක්ස්ට්‍රැක්ටර්ස්<br>ගේජස් ආදිය<br>මිල දී ගත් වර්ෂය - 1994 |

පිහිටා ඇත්තේ අංක 357/1, පරණ අම්බලම, උස්වැටකෙයියාව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11-348

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දෙල්ගොඩ ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2005.04.21 දින සහ අංක 22633 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වීරසූරිය ආරච්චිගේ සුමිත් නිශාන්ත පෙරේරා සහ කංනන්ගරගේ වයලට් යන අය ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ හැටහත්දහස් හත්සිය අසූඅටයි ශත හැත්තෑහත (රු. 8,67,788.77)ක මුදලක් 2008.06.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ට අයවිය යුතුව සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රු. 8,67,788.77මුදලට 2008.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 22633 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මීගහවත්තෙහි පිහිටි "සියඹලාගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ලෙස්ලි එන් ප්‍රනාන්දු විසින් 2001 මැයි මස 08 වැනි දින අංක 887 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "4ඒ" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : අඩි 10ක් පළලැති පාරකින් ද, එස්. ඒ. නිමල්, නිමල් ආරියතිලකට සහ ආර්. ජයකොඩිට අයත් ඉඩම් වලින් ද, නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටසකින් ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටසකින් ද සහ බස්නාහිරට : සයිබ්‍රාන් පෙරේරාට අයත් ඉඩමෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් හයයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 1, පර්. 6.50) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි එකයි හතයි හය (හෙක්. 0.1176)ක විශාල ඉඩමේ ඇති ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළු දේත් සමග වෙලුම්/පත්ඉරු සී 576/166හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ඩී. සී. කොතලාවල විසින් මැන සාදන ලද අංක 118/88 සහ 1988 ජූලි මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "2" (අඩි 10ක් පළල) ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-437/1

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී.- වත්තල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

2008 ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන, ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන්, පී. එල්. සී. නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2482 හා 2007 ඔක්තෝබර් මස 10 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් ෆෙරොස් මොහොමඩ් රාම්ලාන් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත 2008 අගෝස්තු මස 31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙමිලියන හාර ලක්ෂ තිස් නව දහස් අනූවයි ශත අනූ හතක් (රු. 24,39,090.97) මුදලක් සහ රුපියල් දෙමිලියනයක් (රු. 20,00,000) මත 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 29% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී. (මෙහි මින් පසු 'බැංකුව' යනුවෙන් සමහර විට හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

මෙහි පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

එකී අංක 2482 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් දෙමිලියන හාරලක්ෂ තිස් නව දහස් අනූවයි ශත අනූ හතක (රු. 24,39,090.97) මුදල සහ 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොළිය ද, ගාස්තු සහ 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් යන ස්ථානයේ බලයලත් වෙන්දේසිකාර වන ආර්. එස්. එම්. ඔක්ෂන් හි රංජිත එස්. මහානම වෙත 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස,

උපලේඛනය

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් හතර තුළ, ගාල්ල මහ නගර සභා සීමාව තුළ කටුගොඩ පිහිටි වරිපනම් අංක 25සී පල්ලිය පෙදෙස (පාර) අල්ලිමරක්කලගේ වත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩමේ බටහිර කොටසෙහි බලයලත් මිනින්දෝරු ඒ. වීරසිංහ විසින් සාදන ලද අංක 1283 සහ 2005 ඔක්තෝබර් මස 08 වැනි දින දරන සැලැස්මේ අංක 4 වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද එම සම්පූර්ණ ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. එකී අංක 4 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේම කැබලි අංක 1 ද, නැගෙනහිරට : අල්ලිමරක්කලගේ වත්තෙහි ඉතිරි කොටස, දකුණට : මෙම ඉඩමේම අංක 3 සහ 2 දරන ඉඩම් කොටස් සහ පල්ලිය පෙදෙස (පාර) පුංචිවත්ත වෙන් කරමින් බස්නාහිරට : මෙම ඉඩමේම කැබලි අංක 3 සහ 1 සහ ඉහත කී 1283 දරන සැලැස්මට අනුව එහි ප්‍රමාණය පර්චස් දහ අටයි දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.55) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි නවයයි හයයි දෙකකක් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-අයකර ගැනීම්.

11-449/1

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මහරගම ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008.09.25 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී නමට ලියන ලද්දාවූ ද 2000.01.24 දින සහ අංක 157 සහ 2000.05.11 දිනැති අංක 230 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තේවා හෙට්ටිගේ උපාලි ලක්ෂ්මන් සූරියකුමාර් සිල්වා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද මෙහි පහත පළවන උපලේඛණයෙහි විස්තර කර ඇති ඉඩම නැවත මනින ලදුව ඉඩම් කැබලි දෙකකට බෙදා වෙන් කරනු ලැබ බලයලත් මානක ජී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 4901 හා 2004.06.29 දිනැති පිඹුරෙහි ලොට් 1 සහ ලොට් 2 ලෙස දක්වා ඇති හෙයින් ද, එකී අංක 157 සහ 230 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් වලින් කොටසක් බැංකුව වෙත ගෙවන ලදුව, එකී අංක 157 සහ 230 දරන බැඳුම්කර යටතේ අයවීමට ඇති ඉතිරි මුදල අයකර ගැනීම සඳහා එකී අංක 157 සහ 230 දරන බැඳුම්කරයන්ට යටත්ව දේපලෙහි ඉතිරි කොටස ප්‍රමාණවත් ඇපයක් ලෙස බැංකුව තෘප්තියට පත්ව කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද අංක 1389 සහ 2005.05.14 දිනැති ඔප්පුවෙන් අංක 01 දරන ඉඩම් කැබැල්ල මුදා හැර ඇති හෙයින් ද, මෙහි දෙවන උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය එකී බැඳුම්කරය යටතේ අඛණ්ඩව බැංකුව වෙත උකස් කර සහ යටත් කොට බැඳ ඇති බැවින් ද, 2007 මැයි මස 14 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට රුපියල් එක් මිලියන නව ලක්ෂ අටදහස් නවසිය පහයි ශත තිස්හත (රු. 19,08,905.37) ක මුදල එකී බැඳුම්කර යටතේ අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති බැවින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙහි දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති ඉඩම හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත එකී අංක 157 හා 230 දරන බැඳුම්කර මගින් උකස්කර ඇති දේපළ සහ හෝ ඉඩම එකී රුපියල් 19,08,905.37ක මුදල ද, 2007 මැයි 15 වැනි දින විකුණුම් දිනය දක්වා වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් හා දැරීමට සිදු වූ වෙනත් වියදම් ද ඇතොත් ඒවා ද සමග මේ වන විට කරනු ලැබූ යම් ගෙවීමක් ඇත්නම් එය අඩුකර අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි මෙයින් යෝජනා සම්මත කෙරේ.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්වල වෝඩ් අංක 7, කළුබෝවිල, රෝහල පාරෙහි පිහිටි වරිපනම් අංක 69 සහ 71ට අයත් 'රුක්අත්තනගහවත්ත' නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 1 නැමති ඉඩම් කොටසට බලයලත් මානක ජී. බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 1055 සහ 1992 සැප්තැම්බර් මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් සී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල කණ්ඩිය, වරිපනම් අංක 34ට අදාල දේපලෙන් ද, නැගෙනහිරට : ලොට් ඩී වලින් ද, දකුණට : රෝහල පාරෙන් ද, බස්නාහිරට : ලොට් බී වලින් ද, මායිම් වූ එකී අංක 1055 දරන පිඹුර ප්‍රකාරව පර්චස් නවය (අ. 0, රූ. 0, පර්. 9) විශාල ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2080/216 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්වල, වෝඩ් අංක 7, කළුබෝවිල, ශ්‍රී කොටගම වාචිස්සර මාවත (කලින් රෝහල පාර) වරිපනම් අංක 62/4 අයත් රුක්අත්තනගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 2 නමැති ඉඩම් කොටසට බලයලත් මානක ජී. බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 4901 සහ 2004 ජූනි මස 29 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ශ්‍රී කොටගම වාචිස්සර මාවතේ, වරිපනම් අංක 73 සහ 73/1 ට අදාල දේපලේ ලොට් 1ත් ද, නැගෙනහිරට : ශ්‍රී කොටගම වාචිස්සර මාවතේ, වරිපනම් අංක 73 සහ 73/1ත් දරන දේපලෙන් ද, දකුණට : ශ්‍රී කොටගම වාචිස්සර මාවතට අයත් ලොට් 1ත් ද සහ බස්නාහිරට : ලොට් 1ත් ද, මායිම් වූ එකී අංක 4901 දරන පිඹුර ප්‍රකාර පර්චස් තුන (අ. 0, රූ. 0, පර්. 3)ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-437/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නිට්ටඹුව ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2004.04.29 දින සහ අංක 4347 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුතුකුඩ විජේසූරිය ආරච්චිගේ ප්‍රියන්ත විජේසූරිය යන අය ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැටනවදහස් දෙසීය පහයි ශත පහලව (රු. 2,69,205.15)ක මුදලක් 2008.03.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ට අයවිය යුතුව සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රු. 2,69,205.15 මුදලට 2008.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4347 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් උඩුගම්පොල උප කාර්යාලය තුළ උඩුගම්පොල පිහිටි දෙල්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මානක ජේ. කේ. එන්. එස්. ජයකොඩි විසින් 2002 දෙසැම්බර් මස 15 වැනි දින සාදන ලද පොරොන්දු පත්‍රයට අනුව එම ඉඩමටම බලයලත් මානක ජේ. කේ. එන්. එස්. ජයකොඩි විසින් සාදන ලද

2002 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 443 දරන පිඹුරු ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 4බී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරුට : ලොට් 4ඒ ද, නැගෙනහිරට : ස්ටෙපන් විජේසූරියට අයත් ඉඩමෙන් ද, දකුණට : ධර්මසිරි මුණසිංහට අයත් ඉඩමෙන් ද, සහ පාරෙන් ද, බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ එකී අංක 443 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි, පර්චස් එකයි දශම පහ (අ. 0, රූ. 2, පර්. 1.5) ක විශාල ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ281/95 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 4347 දරන බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන ලොට් 4ඒ (මාර්ග අයිතියද) සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-438

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. - මීගමුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මන්ඩලය විසින් විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන, ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන්, පී. එල්. සී. නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් එන්. එල්. ගොඩ්රි කුරේ විසින් සහතික කරන ලද අංක 5764 හා 2006 දෙසැම්බර් මස 19 අංක 5793 හා 2007 පෙබරවාරි මස 13 සහ අංක 5894 හා 2007 ඔක්තෝබර් මස 16 දරන උකස්කර මත ලැබිය යුතු මුදල් ගෙවීම මාතරකිරිගේ ඇන්තනි සරත් ප්‍රනාන්දු පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත 2008 සැප්තැම්බර් මස 08 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් පන් මිලියන හත් ලක්ෂ අනූ හතර දහස් හාරසිය හැත්තෑ දෙකයි ශත පනස් පහක (රු. 57,94,472.55) මුදල සහ රුපියල් දෙමිලියන දෙලක්ෂ අනූ එක් දහස් හයසිය හැට හතයි සහ ශත තිස් හතරක් (රු. 22,91,667.34) සහ රුපියල් දෙමිලියන නව ලක්ෂ විසිහතර දහස් හත්සිය දොළහයි ශත අසූඅටක (රු. 29,24,712.88)ක මුදල මත 2008 සැප්තැම්බර් මස 09 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 29% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. (මෙහි මින් පසු බැංකුව යනුවෙන් සමහර විට හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

මෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

එකී අංක 5764, 5793 සහ 5894 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් පන් මිලියන හත් ලක්ෂ අනූ හතර දහස් හාරසිය හැත්තෑ දෙකයි ශත පනස් පහක (රු. 57,94,472.55) මුදල සහ 2008 සැප්තැම්බර් මස 09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද සහ 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකොට්ටේ, අංක 474, දරන ස්ථානයේ මහානාම ඩ්‍රයිව් හි ආර්. එස්. එම්. ඔක්ෂන්ස් හි රංජිත් එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස,

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාව ඇතුළත කුරණ දෙවන කොට්ඨාශයේ, කොළඹ පාර, වරිපනම් අංක 786/1 දරන බක්මීගහවත්ත සහ මදන්ගහවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩම පිළිබඳව බලයලත් මිනින්දෝරු තැන්පත් ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් මැන සාදන ලද අංක 3696ඒ සහ 2004 සැප්තැම්බර් මස 18 වැනි දින දරන සැලැස්මේ අංක 4 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද එම සම්පූර්ණ ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. එකී අංක 4 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : කැබලි අංක 13 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) නැගෙනහිරට : කැබලි අංක 03, දකුණට : වී. එම්. රොද්‍රිගෝට අයත් ඉඩම බස්නාහිරට : කැබලි අංක 5 සහ එහි ප්‍රමාණය පර්චස් හයයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 6.60) වේ.

බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාව ඇතුළත කුරණ දෙවන කොට්ඨාශයේ බක්මීගහවත්ත සහ මදන්ගහවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩම පිළිබඳව බලයලත් මිනින්දෝරු තැන්පත් ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද අංක 3696ඒ සහ 2004 සැප්තැම්බර් මස 18 වැනි දින දරන සැලැස්මේ අංක 5 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද එම සම්පූර්ණ ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. එකී අංක 5 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : කැබලි අංක 13 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) නැගෙනහිරට : කැබලි අංක 04 ද, දකුණට : වී. එම්. රොද්‍රිගෝට අයත් ඉඩම හා බස්නාහිරට : කැබලි අංක 6 සහ එහි ප්‍රමාණය පර්චස් හයයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 6.60) වේ.

ඉහත 3696A දරන සැලැස්මේ නිරූපිත කැබලි අංක 13 සහ කැබලි අංක 14 බිම් කැබලි වල මාර්ග අයිතිය සහිත වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමණාකරු-අයකර ගැනීම්.

11-449/8

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - ගම්පහ ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

ජයකොඩි ආරච්චිගේ දොන් ප්‍රදීප් රවීන්ද්‍ර, රනවලගේ ෂෙල්ටන් ගෝමස් හා වීරප්පුලිගේ මේරි ජසින්තා ප්‍රනාන්දු විසින් බැඳුම්කරුවන් වශයෙන් ද, රනවලගේ ෂෙල්ටන් ගෝමස් හා වීරප්පුලිගේ මේරි ජසින්තා ප්‍රනාන්දු උකස්කරුවන් වශයෙන් ද, කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. කේ. එන්. පී. විතාන විසින් සහතික කරන ලද අංක 8531 සහ 2007 මාර්තු 22 වැනි දින දරන සහ අංක 9260 හා 2007 නොවැම්බර් මස 01 වැනි දින දරන උකස්කර මත ලැබිය යුතු මුදල් ගෙවීම, පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කර මත 2008 අගෝස්තු මස 15 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් දෙමිලියන දෙලක්ෂ විසිදෙදහස් දෙසිය අසූ අටයි ශත හැටහයක (රු. 22,22,288.66) මුදලක් සහ රුපියල් හාර ලක්ෂ හැටහය දහස් හයසිය හැත්තෑ දෙකක (රු. 4,66,672) මුදල මත 2008 අගෝස්තු 16 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 31% බැගින් පොළිය ද, රුපියල් හත් ලක්ෂයක (රු. 7,00,000) මුදල මත 2008 අගෝස්තු මස 16 දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමකරන තෙක් වර්ෂයකට 31% බැගින් පොළිය ද, රුපියල් නවලක්ෂ හත්දහස් විසිදෙකයි ශත පනස් නමයක (රු. 9,07,022.59) මුදල මත 2008 අගෝස්තු මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 38% බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ.

එකී අංක 8531 සහ 9260 දරන උකස්කර යටතේ අයවිය යුතු එකී රුපියල් දෙමිලියන දෙලක්ෂ විසි දෙදහස් දෙසිය අසූ අටයි ශත හැට හයක ( රු. 22,22,288.66) මුදල සහ ඉහත සඳහන් කරන ලද දිනවල සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තාවූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 දරන ස්ථානයේ මහානාම ඩ්‍රයිව් හි ආර්.එස්. එම්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු වන රංජිත් එස්. මහානාම වෙත 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ කඳාන ගමෙහි පිහිටි රාජමන්ත්‍රී ජයසූරිය මාවතේ, වරිපනම් අංක 77/11 දරන සියඹලාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද අංක 9929 හා 2006.12.20 දින දරන සැලැස්මේ නිරූපිත ලොට් 2 දරන බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කර සීමා නිර්ණය කර ඇති එකී ලොට් අංක 2 දරන බිම් කැබැල්ලට මායිම් උතුරට: කැබලි අංක 1B හා 1A ද ; නැගෙනහිරට : නගර සභා පාර ද; දකුණට : කැබලි අංක 03 සහ කිරිඇල්දෙණියගේ මරතේලිස්ට අයිති ඉඩම ද ; බස්නාහිරට : කිරිඇල්දෙණියගේ මර්තේලිස්ට හා බෝපේ ආරච්චිට අයිති ඉඩම ද සහ එහි ප්‍රමාණය පර්චස් විසි හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 24.50) සහ එහි තුළ ඇති සියළු දේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු- ණය අයකර ගැනීම්.

11-449/3

---

### ලංකා බැංකුව - පුද්ගලික ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.09.29 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජී. සී. පී. තිලකරත්න විසින් සහතික කරන ලද 2006.09.14 දිනැති අංක 3000 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.08.31 දින තෙක් පොලිය වශයෙන් රුපියල් පනස්අටලක්ෂ තිස්හතර දහස් දෙසිය තිස්එකයි ශත තිස්හතක (රු.58,34,231.37) මුදලක් සමග රුපියල් හතලිස් අට ලක්ෂ දාහතර දහස් හාරසිය අසූතුනයි ශත හැත්තෑතුනක (රු.48,14,483.73) මුදලක් මත වසරකට සියයට දහතුනයි දශම හතයි දෙක (13.72%) බැගින් පොලියක්, 2008.09.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් නුගේගොඩ, වලව්වත්ත පාර, අංක 18/19 හි පදිංචි බාලසිංහම් ජෝන් වසන්තබාලන් යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3000 දරන බැඳුම්කරය මත 2008.08.31 දින තෙක් අයවිය යුතු රුපියල් පනස් අටලක්ෂ තිස්හතර දහස් දෙසිය තිස්එකයි ශත තිස්හතක (රු.58,34,231.37) මුදල සහ 2008.09.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474 හි පදිංචි වෙන්දේසිකාර රංජිත සිරිවර්ධන මහානාම මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397) අධිකාරය හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, පුද්ගලික ශාඛාවේ, ශාඛා කළමනාකරුටද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

#### විකිණීමට ඇති දේපල

*පළමුවැනි උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, මහරගම නගර සභා සීමාවේ ගංගොඩවිල පිහිටි වලව්වත්ත පාර, තක්සේරු අංක 18/19 දරන 'ගුණවර්ධන උයනවත්ත' නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මහතා විසින් සාදන ලද

2000 නොවැම්බර් 29 දිනැති අංක 681 දරන පිඹුරේ ලොට් 14 වශයෙන් සඳහන් වන අතර, එය උතුරට : සරත් ඩයස්ට හා වෙනත් අයට අයත් ඉඩම (බලයලත් මිනින්දෝරු සී. ආර්. හාර්ඩින් මහතා විසින් සකස් කරන ලද අංක 135 දරන පිඹුරේ ලොට් බී)ද, නැගෙනහිරට : ලොට් 15 ද, දකුණට: ලොට් 16 ද, බස්නාහිරට : ලොට් 13 හා 12 ද මායිම්ව පර්චස් අටයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 8.80) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි දෙකයි තුනක (හෙක්. 0.0223) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2475/257 යටතේ ලියාපදිංචි කර ඇත.

*දෙවැනි උපලේඛනය*

1. ඉහත කී ගංගොඩවිල පිහිටි 'ගුණවර්ධන උයනවත්ත' නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා මහතා විසින් සාදන ලද 2000 ජූලි මස 14 දිනැති අංක 181/2000 දරන පිඹුරේ ලොට් A1 (පාරට වෙන්කළ) ලෙස සඳහන් බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ගම්සභා පාරද (දැන් වලව්වත්ත පාර), නැගෙනහිරට : අංක 135 දරන පිඹුරේ ලොට් B ලෙස දක්වා ඇති දැනට සරත් ඩයස්ට හා වෙනත් අයට අයිති ඉඩමද, දකුණට : අංක 135 දරන පිඹුරේ ලොට්B ලෙස දක්වා ඇති දැනට සරත් ඩයස්ට හා වෙනත් අයට අයිති ඉඩම සහ ලොට් C1 ද, බස්නාහිරට : කලින් ප්‍රැන්සිස් සිල්වාට හා දැනට තක්සේරු අංක 12 හා 14 දරන වලව්වත්ත පාර පරිශ්‍රයද මායිම්ව ඉහත කී අංක 181/2000 දරන පිඹුරේ දක්වා ඇති ආකාරයට පර්චස් පහළොවයි දශම හතයි පහක (අ. 0, රූ 0, පර්. 15.75) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2475/259 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් සාදන ලද 2000 ඔක්තෝබර් 26 දිනැති අංක 667 දරන පිඹුරේ මැනදී මැනීමකට අනුව පහත සඳහන් ආකාරයට විස්තර කොට ඇත.

එකී ගංගොඩවිල පිහිටි 'ගුණවර්ධන උයනවත්ත' නමැති ඉඩම ඉහත කී අංක 667 දරන පිඹුරේ ලොට් 1A (පාරට වෙන්කළ) වශයෙන් දක්වා විස්තර කර ඇති බෙදූ ඉඩම උතුරට වලව්වත්ත පාරද, නැගෙනහිරට සරත් ඩයස් හා වෙනත් අයට අයිති ඉඩම (බලයලත් මිනින්දෝරු සී. ආර්. හාර්ඩින් විසින් සාදන ලද අංක 135 දරන පිඹුරෙහි ලොට් 3) ද, දකුණට ලොට් 1C හා අඩි 10 පාරද (අංක 959 දරන පිඹුරේ ලොට් 5) ද, බස්නාහිරට අංක 959 දරන පිඹුරේ ලොට් 2 හා වලව්වත්ත පාර, තක්සේරු අංක 12 හා 14 දරන කලින් ප්‍රැන්සිස් සිල්වාට අයිති ඉඩමද මායිම්ව ඉහතකී අංක 667 දරන පිඹුරේ සඳහන් ආකාරයට පර්චස් පහළොවයි දශම තුනයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 15.30) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි අටයි හතක (හෙක්. 0.0387) ප්‍රමාණයෙන් යුක්තවේ.

2. ඉහතකී ගංගොඩවිල පිහිටි 'ගුණවර්ධන උයන්වත්ත' නැමැති, බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් සාදනලද 2000 නොවැම්බර් 29 දිනැති අංක 681 දරන පිඹුරෙහි විස්තර කර ඇති ආකාරයට ලොට් 1 යනුවෙන් සඳහන් කර ඇති (දැනට පාර පළල් කිරීම සඳහා මීටර් 0.6 ක් වූ පාරට වෙන්කළ කොටස) බෙදූ ඉඩම උතුරට : පාර (අංක 959 දරන පිඹුරේ ලොට් 5) ද සහ මීටර් 6 පාර (අංක 667 දරන පිඹුරෙහි ලොට් A1) ද, නැගෙනහිරට : ලොට් 2, දකුණට : ලොට් 2 හා 48 ද, බස්නාහිරට: පාර (අංක 959 දරන පිඹුරේ ලොට් 5) ද මායිම්ව, ඉහතකී අංක 681 දරන පිඹුරේ දක්වා ඇති ආකාරයට පර්චස් බිංදුවයි බිංදුවයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 00.90) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි දෙකයි තුනක (හෙක්: 0.0023) ප්‍රමාණයෙන් යුක්තය. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2773/224 යටතේ ලියාපදිංචි කර ඇත.

3. ඉහතකී ගංගොඩවිල පිහිටි 'ගුණවර්ධන උයනවත්ත' නැමැති, ඉඩම බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර මහතා විසින් සාදනලද 2000 නොවැම්බර් 29 දිනැති අංක 681 දරන පිඹුරෙහි දක්වා ඇති ආකාරයට ලොට් 2 යනුවෙන් සඳහන් කර ඇති (පාරට වෙන්කළ කොටස) බෙදා වෙන්කළ ඉඩම් කැබැල්ල උතුරට ලොට් 1 හා මීටර් 6 පාර (අංක 667 දරන පිඹුරෙහි ලොට් A1) සහ ලොට් 3, 5, 6, 7, 8, 9 හා 13 ද, නැගෙනහිරට ලොට් 4,3,19 හා 20 ද, දකුණට ලොට් 37, 40, 41, 42, 46, 47 සහ 48 ද, බස්නාහිරට ලොට් 1 ද, මායිම්ව ඉහතකී අංක 681 දරන පිඹුරට අනුව පර්චස් තිස්නවයක (අ. 0, රූ. 0, පර්. 39) ප්‍රමාණයෙන් යුක්තය. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2475/266 යටතේ ලියාපදිංචි කර ඇත.

4. ඉහතකී ගංගොඩවිල පිහිටි 'ගුණවර්ධන උයනවත්ත' නැමැති අංක 681 දරන පිඹුරෙහි ලොට් 37 ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල (පාරට වෙන්කළ කොටස) උතුරට ලොට් 22,44 හා 38 ද, නැගෙනහිරට ලොට් 20,21,22,24,25,44,43 හා 42 ද, දකුණට ලොට් 36,35,34,33, හා 32 ද, බස්නාහිරට අංක 680 දරන පිඹුරෙහි ලොට් 40,39,38 ලොට් 2 හා ලොට් 45 ද හා 46 ද, මායිම්ව ඉහත සඳහන් අංක 681 දරන පිඹුරට අනුව පර්චස් තිස්දෙකයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 32.70) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි දෙකයි හතක (හෙක්: 0.0827) ප්‍රමාණයෙන් යුක්තය. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2475/260 යටතේ ලියාපදිංචි කර ඇත.

5. ඉහතකී ගංගොඩවිල පිහිටි 'ගුණවර්ධන උයනවත්ත' නැමැති අංක 681 දරන පිඹුරෙහි ලොට් 13 ලෙස දක්වා ඇති බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල (පාරට වෙන්කළ කොටස) උතුරට : ලොට් 12 හා 14 ද, නැගෙනහිරට : ලොට් 16, 17, 18 හා 19 ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට: ලොට් 9 සහ 10 ද, මායිම්ව ඉහත කී අංක 681 දරන පිඹුරට අනුව පර්චස් හතයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 7.80) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි නවයයි හතක (හෙක්: 0.0197) ප්‍රමාණයෙන් යුක්තය. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2475/261 යටතේ ලියාපදිංචි කර ඇත.

6. ඉහතකී ගංගොඩවිල පිහිටි 'ගුණවර්ධන උයනවත්ත' නැමැති අංක 681 දරන පිඹුරෙහි ලොට් 16 ලෙස දක්වා ඇති බෙදා වෙන්කළ ඉඩම් කැබැල්ල (පාරට වෙන්කළ කොටස) උතුරට : ලොට් 14 ද, නැගෙනහිරට: ලොට් 15 ද, දකුණට : ලොට් 17 ද, බස්නාහිරට : ලොට් 13 ද, මායිම්ව ඉහත සඳහන් අංක 681 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම හතයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 1.70) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතරයි තුනක (හෙක්: 0.0043) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2722/31 යටතේ ලියාපදිංචි කර ඇත.

එස්. දිසානායක,
ජ්‍යෝෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
පුද්ගලික ශාඛාව

11-443

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මීගමුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්

සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන, ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී. නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් එස්. ජේ. අතපත්තු විසින් සහතික කරන ලද අංක 8865 හා 2002 නොවැම්බර් මස 20 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම වීරසිංහ මුදියන්සේලාගේ සිරන්ත සහ ගුරුසිංහගේ සුමනදාස සිල්වා යන අය බැඳුම්කරුවන් වශයෙන් ද, ගුරු සිංහගේ සුමනදාස සිල්වා උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත 2008 සැප්තැම්බර් මස 03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ තිස් නව දහස් හත්සිය අසූ හතයි ශත තිස් හතක (රු. 1,39,787.37) මුදල සහ රුපියල් එක්ලක්ෂ තිස් එක් දහසක (රු. 1,31,000) මුදල මත 2008 සැප්තැම්බර් මස 04 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නම කරන දින තෙක් වර්ෂයකට 29% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී. (මෙහි මින් පසු "බැංකුව" යනුවෙන් සමහර විට හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

මෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ.

එකී අංක 8865 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් එක්ලක්ෂ තිස්නව දහස් හත්සිය අසූහතයි ශත තිස් හතක (රු. 1,39,787.37) මුදල සහ 2008 සැප්තැම්බර් මස 04 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද සහ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 දරන ස්ථානයේ මහනාම ඩ්‍රයිව් හි ආර්.එස්. එම්. ඔක්ෂන්ස්හි රංජිත් එස්. මහානාම වෙත 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, කටුනායක කුරණ පිහිටි, දවටගහවත්ත සහ තලගහවත්ත නමැති යාබද ඉඩමේ කැබලි අංක 4 දරන කොටසට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ආර්. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 7641 සහ 1955 ජනවාරි මස 28 වැනි දින දරන පිඹුර ප්‍රකාර එකී අංක 4 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : ඇල ද ; නැගෙනහිරට : කැබලි අංක 3; දකුණට : පාරක් සඳහා වෙන් කරන ලද කොටස සහ බස්නාහිරට : කැබලි අංක 5 සහ එහි ප්‍රමාණය පර්චස් විසි නවයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 29.5) සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ සියලු දේ සමඟ වේ.

මෑතකදී සාදන ලද අංක 5974/1992 දරන පිඹුරට අනුව එකී ඉඩමට පහත පරිදි වේ :

බස්නාහිර පළාතේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, කටුනායක, සීදූව නගර සභා සීමාව තුළ කුරණ කටුනායක පිහිටි දවටගහවත්ත සහ තලගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 4ට මායිම්, උතුරට : ඇල ද, නැගෙනහිරට : එස්. සී. ජයවර්ධනට අයත් කැබලි අංක 3, දකුණට : බෝට් ක්ලබ් පාර සහ බස්නාහිරට : ලියෝ පෙරේරාට අයත් කැබලි අංක 5 සහ එහි ප්‍රමාණය බලයලත් මිනින්දෝරු එච්. එල්. සී. දාබරේරා විසින් මැන සාදන ලද එකී අංක 5974/1992 සහ 1992.09.29 වැනි දින දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි නවයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 29.5) සහ එහි පිහිටි සියලු දේ සහිත වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු- අයකර ගැනීම්.

11-449/9

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - බම්බලපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

මාර්තා ජයමානි තේවරාජ් විසින් කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී. නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1951 සහ 2005 මාර්තු මස 17 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කර මත 2008 අගෝස්තු මස 29 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් එක් මිලියන අටලක්ෂ අනූ දෙදහස් හාරසිය හැත්තෑ එකයි ශත තිස් හතරක (රු. 18,92,471.34) මුදල සහ රුපියල් හත්ලක්ෂ තිස්තුන් දහස් අටසිය හතලිස් හතයි ශත දහතුනක (රු. 7,33,847.13) මුදල මත 2008.08.30 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 30% බැගින් පොළිය ද පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්පසු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

එකී අංක 1591 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් එක් මිලියන අටලක්ෂ අනූදෙදහස් හාරසිය හැත්තෑ එකයි ශත තිස්හතරක මුදල සහ ඉහත සඳහන් කරන ලද 2008.08.30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොළිය ද ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද, මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිට කෝට්ටේ, අංක 474, මහනාම ඩ්‍රයිව් ආර්. එස්. එම්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ (කොළඹ රෙජිස්ට්‍රාර් කොට්ඨාශයේ) (හැඳල උප කාර්යාලය) වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල ග්‍රාමයේ කෙරවලපිටිය පිහිටි ශාන්ති මාවතේ වරිපනම් අංක 81 දරන දවටගහ කුඹුර ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් සාදන ලද අංක 363 හා 1994.12.20 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් 4ඒ බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති එකී ලොට් අංක 4ඒ බිම් කැබැල්ලට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එන්. එස්. පෙරේරා විසින් සකසන ලද 2022/ඒ දරන 1993.03.21 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් අංක 5 (අඩි 12 පළල පාර සඳහා වෙන් කරන ලද කොටස) ද, නැගෙනහිරට : ශාන්ති පාර ද, දකුණට රූපා ඇල සහ බස්නාහිරට : 2022/A දරන සැලැස්මේ කැබලි අංක 3 (දැනට ජී. ජයවික්‍රමට අයත් ඉඩම) සහ එහි ප්‍රමාණය පර්චස් එකොළහයි (අ. 0, රූ. 0, පර්. 11) සහ එහි තුළ අති සියලු දේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අයකර ගැනීම්.

11-449/6

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී.-පානදුර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

සහබන්දු මුහන්දිරම්ගේ දෝන ශ්‍රීමති මාලා විසින් කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපෙරේෂන් පී. එල්. සී. නමට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඩී. එස්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 2276 සහ 2005 ඔක්තෝබර් 14 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්ද, එකී උකස්කරය මත 2008 ජූලි මස 21 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හාර ලක්ෂ තිස්පන් දහස් හාරසීය දහහතයි ශත දෙකක (රු.435,417.02) මුදලක් සහ රුපියල් තුන් ලක්ෂ හැත්තෑ අට දහස් හයසිය අසූවයි ශත දහතුනක (රු. 378,680.13) මුදල මත 2008 ජූලි මස 22 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 29% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී. (මෙහි මින් පසු බැංකුව යනුවෙන් සමහර විට හඳුන්වනු ලබන) වෙත අය විය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, මෙහි පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

එකී අංක 2276 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හාර ලක්ෂ තිස් පන්දහස් හාරසීය දාහතයි ශත දෙකක (රු.435,417.02) මුදල හා 2008.07.22 දින සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා බැංකුවට උකස් කර ඇත්තා වූද මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 දරන ස්ථානයේ මහානාම බ්‍රයිට් හි, ආර්. එස්. එම්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, තොටමුනෙහි පානදුර කල්පිටි දෙබැද්ද අලුබෝමුල්ලෙහි පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද අංක 5816 හා 1979.09.02 දින දරන සැලැස්මේ නිරූපිත ලොට් B7 දරන බිම් කැබැල්ල වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එකී ලොට් B7 දරන බිම් කැබැල්ලට මායිම් උතුරට : මෙම ඉඩමේම ලොට් අංක B8 ද, නැගෙනහිරට : ලෙවිස් කුරේ හා අනිකුත් යන අයට අයිති ඉඩම ද දකුණට : මෙම ඉඩමේම කැබලි අංක B6 සහ බස්නාහිරට : මෙම ඉඩමේම කබැලි අංක B5 ද, සහ එහි ප්‍රමාණය පර්චස් විස්සක් (අ.0, රූ. 0, පර්. 20.00)සහ එහි තුළ ඇති සියලු දේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අයකර ගැනීම්.

11-449/7

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී.-පිටකොටුව ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී එල් සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

පලනියන්ඩි කන්දකුමාර් විසින් කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන, ලියාපදිංචි අංක පී. කිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන්, පී එල් සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බන්දුල විජේසිංහ විසින් සහතික කරන ලද අංක 1736 සහ 2003.11.25 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස්කරය මත 2008.08.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් පන් මිලියන තුන් ලක්ෂ හත් දහස් නවසිය අසූවයි ශත නවයක (රු.5,307,980.09) ක මුදලක් සහ රුපියල් පන් මිලියන තුන් ලක්ෂ හත්දහස් නවසිය අසූවයි සත නවයක (රු.5,307,980.09) මුදල මත 2008.09.01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 38% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී එල් සී (මෙහි මින් පසු බැංකුව යනුවෙන් සමහර විට

හඳුන්වනු ලබන) වෙත අය විය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, මෙහි පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. එකී අංක 1736 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් පස් මිලියන තුන් ලක්ෂ හත් දහස් නවසියයි අසූවයි සත නවයක (රු.5,307,980.09) මුදල සහ ඉහත සඳහන් කරන ලද 2008.09.01 දිනවල සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද,

එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූද, මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස,

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ මුතුවාල් කොට්ඨාසයේ නව මෝදර වීදියේ වරිපනම් අංක 4030/13 දැරූ ඉන්පසු අංක 45,45/1 දැරූ සහ දැන් අංක 41/4 දරන (රිවර්සයිඩ් නම් ඉඩමෙහි නැවත බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු පී. අතුරලිය විසින් සාදන ලද 1955.04.02 දින දරන සැලැස්මේ නිරූපිත ලොට් අංක 4 දරන බිම් කැබැල්ල වශයෙන් ලකුණු කරන බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ලොට් 4 දරන බිම් කැබැල්ලට මායිම් උතුරට : වරිපනම් අංක 80/5 සහ 63/15 දරන 4 නිවෙස් ද, නැගෙනහිරට : ලොට් අංක 8 ද, දකුණට : ලොට් අංක 5 සහ 7 ද, බස්නාහිරට : ලොට් අංක 2 සහ වරිපනම් අංක 80/5 දරන දේපල ද, සහ එහි ප්‍රමාණය පර්චස් විස්සක් සහ දශම පහක් (අ. 0, රූ. 0, පර්. 20.50) සහ එකී අංක 629 දරන සැලැස්මට අනුව එහි තුළ ඇති ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ.

එකී අංක 629 දරන සැලැස්මේ නිරූපිත ලොට් අංක 2, 3 සහ 7 මතින් වූ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමණාකරු අයකරගැනීම්.

11-449/5

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී.-වත්තල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීම

2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

කලින් පැන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියා පදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන්, පී. එල්. සී නමට

(1) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2287 සහ 2007 පෙබරවාරි මස 09 වැනි දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම "ඒ. ආර්. ට්‍රේඩින්" හි හවුල්කරුවන් වන සින්නයියා දේවගුරුනාතන් සහ මෙස්ත්‍රිගේ චමිලා නිශාන්ති සිල්වා බැඳුම්කරුවන් වශයෙන් ද, සින්නයියා දේවගුරුනාතන් උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

(2) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ගොඩ්ෆ්‍රි කුරේ විසින් සහතිකර කරන ලද අංක 5784 සහ 2007 පෙබරවාරි මස 07 වැනි දින සහ අංක 5772 සහ 2007 අගෝස්තු මස 14 වැනි දින දරන උකස් කර මත ලැබිය යුතු මුදල් ගෙවීම "ඒ. ආර්. ට්‍රේඩින්" හි හවුල්කරුවන් වන සින්නයියා දේවගුරුනාතන් සහ මෙස්ත්‍රිගේ චමිලා නිශාන්ති සිල්වා ණයකරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

(අ) උකස්කර අංක 2287 මත, 2008 අගෝස්තු මස 31 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හත්ලක්ෂ පන්දහස් හැට හතරයි ශත හතලිස් හතක (රු. 7,05,064.47) මුදලක් සහ රුපියල් හයලක්ෂ පනස් එක් දහස් හයසිය හැත්තෑ හයක (රු .6,51,676) මුදල මත 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 28% බැගින් පොලිය ද,

(ආ) උකස්කර අංක 5784 මත රුපියල් එක් මිලියන තුන්ලක්ෂ අනූහය දහස් එකසිය විසි තුනයි ශත විසිහතක (රු. 13,96,123.27) මුදල මත සහ රුපියල් එක් මිලියන තුන්ලක්ෂ දොලොස් දහස් පන්සීයයක (රු .13.12,500) මුදල මත 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයටක 28% බැගින් පොලිය ද,

(ඇ) උකස්කර අංක 2287, 5784 සහ 5872 මත, රුපියල් එක් මිලියන හයලක්ෂ විසිහත් දහස් හාරසිය විසි අටයි ශත විස්සක (රු. 16,27,428.20) මුදල මත සහ එකී රුපියල් එක් මිලියන හයලක්ෂ විසිහත් දහස් හාරසිය අටයි ශත විස්සක (රු. 16,27,428.20) මුදල මත 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින වෙත් වර්ෂයකට 38% පොලිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. (මෙහි මින් පසු බැංකු යනුවෙන් සමහර විට හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ගෙවිය යුතුව තිබෙන හෙයින් ද,

මෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ.

එකී අංක 2287, 5784 සහ 5872 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් තුන් මිලියන හත් ලක්ෂ විසි අටදහස් හයසිය පහළොවයි හත අනූ හතරක (රු. 37,28,615.94) ක මුදල සහ 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද සහ 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකරග ත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා බැංකුවට බැඳුම්කර අංක 2287 යටතේ උකස්කර ඇත්තා වූ ද, මෙහි පහත පළමු උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද සහ බැඳුම්කර අංක 5784 සහ 5872 යටතේ උකස්කර ඇත්තා වූ මෙහි පහත දෙවන උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ අංක 474 දරන ස්ථානයේ මහානාම ඩ්‍රයිව් හි ආර්. එස්. එම්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 04 දරන

බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස,

**ඉහත සඳහන් පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර දිස්ත්‍රික්ක ලේකම් කොට්ඨාශයේ (නාරංවල උප කාර්යාලය) මහර ප්‍රාදේශීය සභා සීමාවෙහි උඩුපිල පිහිටි උඩුපිල එස්ටේට් නම් ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 2213 සහ 2002.03.26 වැනි දින දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 2200 සහ 2002.03.04 දින දරන පිඹුරේ කැබලි අංක 1 සහ 2හි ඒකාබද්ධ කිරීමක් සහ කොටස් බෙදා වෙන් කිරීමක් වන) කැබලි අංක 103 වශයෙන් ලෙස බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එකී අංක 103 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : කේ. ඒ. පියදාසට අයිති ඉඩම, නැගෙනහිරට : පිඹුරු අංක 2213හි කැබලි අංක 104, දකුණට : පිඹුරු අංක 2213හි කැබලි අංක 108 සහ බස්නාහිරට : පිඹුරු අංක 2213හි කැබලි අංක 102 හි එකී පිඹුරු අංක 2213ට අනුව එහි ප්‍රමාණය පර්චස් දහතුනයි දශම දෙකයි හතර (අ. 0, රූ. 0, පර්. 13.24) හෝ හෙක්ටයාර් 0.0335 සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සියලු දේ සමග වේ.

කැබලි අංක 108, 111 සහ 124 දරන මාර්ග අයිතීන් ද සමග වේ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත් කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඳාන උප කාර්යාලයේ නාගොඩ ගමෙහි මොරවත්තෙහි පිහිටි මොරවත්ත පාරේ, වරිපනම් අංක 141/41සී, දරන කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 1786බී සහ 1999.12.31 දින දරන පිඹුරෙහි අංක 1 ලෙස බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එකී අංක 1 දරන බිම් කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : පී. ප්‍රනාන්දුගේ ඉඩම සහ එහි ප්‍රමාණය පර්චස් හයයි (අ. 0, රූ. 0, පර්. 6) සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සියලු දේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමණාකරු අයකරගැනීම්.

11-449/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.